සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**වර්ෂ අවසාන ඇගයීම - 2012**

72489

**11 - ශ්‍රේණිය**

# සිංහල භාෂාව හා සාහිත්‍යය - I

නම / විභාග අංකය : ............................................................................ කාලය පැය 01 යි.

සැලකිය යුතුයි

(i) සියලු ම ප්‍රශ්නවලට උත්තර ලියන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති 1, 2, 3, 4 උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ උත්තරය තෝරන්න.

(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

- අංක 01 සිට 03 තෙක් ඇති එක් එක් තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අදහසට වඩාත් සමීප අදහස තෝරන්න.

01. මෙවර ලෝක කුසලානය සඳහා ලංකාව හා එංගලන්තය **කරට කර** තරග වැදුණේ ය.
   1. ප්‍රතිවිරුද්ධ ව  2. සමාන සමත්කම් ඇති ව
   3. ජයග්‍රාහී ව  4. පසමිතුරන් ව

02. මානව හිමිකම් **දඬමීමා කර ගෙන** එක්සත් ජාතීන්ගේ සංවිධානය නගන චෝදනා ලංකාවට අභියෝගයකි.
   1. අනාවරණය කරගෙන  2. අනතුරට හෙළා
   3. අයුතු ලෙස යොදාගෙන  4. දඬයම් කර

03. ඇතැම් පුද්ගලයින් **ඉවක් බවක්** නැතිව කරන ප්‍රකාශ භාෂායට ලක්වීම වැළැක්විය නොහැකි ය.
   1. අනායාසයෙන්  2. අපරීක්ෂාකාරීව  3. අනවරතයෙන්  4. අනවසරයෙන්

- අංක 04 සිට 08 තෙක් ඇති එක් එක් වාක්‍යයේ හිස්තැනට වඩාත් ගැළපෙන පදය තෝරන්න.

04. කොළඹ යුගයේ දෙවන පරපුරේ කවීහු බටහිර කවියෙන් ........................ ලැබූහ.
   1. ආභාසය  2. අභ්‍යාසය  3. අධ්‍යාශය  4. ආස්වාදය

05. ඇගයීම් කාර්යයේ ........................ වනුයේ, තම අධ්‍යාපන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීමට ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සහාය වීම ය.
   1. පරීක්ෂාව  2. උපේක්ෂාව  3. සාපේක්ෂතාව  4. අපේක්ෂාව

06. කොග්ගල මහා ප්‍රාඥයා හෙවත් මාර්ටින් වික්‍රමසිංහ මහතා ප්‍රථම ................ නවකතාව රචනා කළේ ය.
   1. විචාරවාදී  2. භෞතිකවාදී  3. යථාර්ථවාදී  4. න්‍යායවාදී

07. විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුහු තම .................. පරිදි පාඨමාලා තෝරා ගත්තේ ය.
   1. අභිමතය  2. අභිචාරය  3. අභිදානය  4. අභිප්‍රේරණය

08. බොහෝ පැරණි කවීහු ........................ යුතු ව බස හැසිර වූහ.
   1. කුතුහලයෙන්  2. සංයමයෙන්  3. සංගතයෙන්  4. සංගමයෙන්

09. අකාරාදි පද පිළිවෙළ නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.
   1. තිලුක, නාමලී, නේලුක, නෝනිස්  2. දීප්ති, දර්ශි, දොපදී, දුෂ්‍යන්ත
   3. තරිඳු, තාරක, තුළිනි, තුඩානි  4. කිත්මලී, කේසර, කෝසල, කෞශල්‍යා

- අංක 10 සිට 12 තෙක් ඇති එක් එක් පද යුගලයෙහි දෙවන පදය (1) පළමු වැන්නට අර්ථයෙන් සමාන වේ ද (2) පළමුවැන්නට අර්ථයෙන් විරුද්ධ වේ ද (3) පළමු වැන්නේ අර්ථය වැඩි කරයි ද (4) පළමු වැන්නට වෙනස් අර්ථයක් සහිත වේ ද? යන්න තෝරන්න.

10. චන්ද්‍රයා - උළිඳු (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්
11. කොමල් - සුකොමල (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්
12. රෝග - ආරෝග්‍ය (1) සමාන (2) විරුද්ධ (3) වැඩි (4) වෙනස්

13. ඌෂ්මාක්ෂර පමණක් යෙදුණු පද පේළිය තෝරන්න.
 1. ශ, ෂ, ඩ, ඪ, ණ 2. ශ, ෂ, ස, හ, ළ 3. ය, ර, ල, ව 4. ශ, ෂ, ස, හ, ෆ

- අංක 14 සිට 15 තෙක් අක්ෂර වින්‍යාසය නිවැරදි වාක්‍ය තෝරන්න.

14. 1. හිමිදිරි උදෑසන කෙත බලන්නට ගිය ගොවියා ගොයම් පැලවලට සිදුව ඇති විනාශය දුටුවේ ය.
 2. ගෙවත්තේ නිෂ්පාදනය කෙරෙන භෝග පරිභෝජනය තුළින් අපි අපරිමිත ආස්වාදයක් ලබමු.
 3. ගහකොළ වනසමින් මහා කුනාටුව හමා ගියේ ය.
 4. කෙටි කතාවක ඒකීය ධාරනාවක් තිබිය යුතු ය.

15. 1. ඇතැම් විද්‍යුත් මාධ්‍ය මගින් බසට කරන හානිය සුළුපටු නොවේ.
 2. රජයේ කාර්යාල පද්ධතිය නවීකරණය කළ යුතුයයි යෝජනා විය.
 3. ශික්ෂන රෝහල් සංකීර්ණය විවෘත කිරීම සඳහා ඇමතිතුමා පැමිණියේ ය.
 4. විශ්වවිද්‍යාල අනද්‍යයන කාර්ය මණ්ඩල වැඩි වැටුප් ඉල්ලා වැඩ වරති.

- අංක 16 සිට 17 තෙක් එක් එක් ප්‍රශ්නයේ මුලින් ඇති පදයේ නිවැරදි විසන්ධිය තෝරන්න.

16. කොළොම්තොට
 1. කොළොඹ+තොට 2. කොළොම්+තොට 3. කොළඹ+තොට 4. කොළොං+තොට

17. කාලෝචිත
 1. කාලෝ+උචිත 2. කාල+උචිත 3. කාල+ඕචිත 4. කාලඕ+චිත

18. යුගල පදයක් **නොවන** පදයක් ඇතුළත් වී ඇති වරණය තෝරන්න.
 1. ගම් බිම්, ගෝරි බෝරි, ගල් මුල්, ගුණ දොස් 2. සට කපට, සැර වැර, සරු සාර, සිතුම් පැතුම්
 3. හීන දීන, බාර දූර, හැඩ වැඩ, හිතා මතා 4. වංහුං, විස් කම්, වට පිට, වැර වෑයම්

19. කමල, සතත, විකසිත, නිසයුරු යන පදවල අදහස් පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
 1. නිරතුරු, චන්ද්‍රයා, පුල්, නෙළුම් 2. නෙළුම්, පුල්, චන්ද්‍රයා, නිරතුරු
 3. නෙළුම්, නිරතුරු, පුල්, චන්ද්‍රයා 4. පුල්, චන්ද්‍රයා, නෙළුම්, නිරතුරු

20. එක් එක් වරණයෙහි පද තුනක් හා ඒවායේ තේරුම් දී ඇත. **වරදවා ඇති** පදයක් ද සහිත වරණය තෝරන්න.
 1. උවදුර - පිරිපත, සැක - බිය, සිත්කලු - මනස්කාන්ත
 2. බිරිය - ඇඹෑණි, බ්‍රහ්මයා - බඹ, පණ්ඩිත - පැණවත්
 3. පතළ - පවර, පිළ - පීඨය, දිය - ලෝකය
 4. රශ්මිය - තෙද, ළකල් - මිහිරි, තුමුළ - මහත්

21. මුලින් දී ඇති පදයට බහ්අර්ථ දෙන පද පමණක් **යෙදී ඇති** වරණය තෝරන්න.
 1. නල - සුළඟ, ප්‍රමාදය, වහා, විල 2. තුරු - තාරකාව, පමා, ගස, තල
 3. උදුල - බබළන, දිළිසෙන, දිදුලන, ජ්වලිත 4. රස - රාශිය, රශ්මිය, රසඳිය, රාගය

22. සමාස පදයක් **යෙදී නැති** වරණය තෝරන්න.
 1. එදා ඔබ මට සරාසඳ විය 2. තෙල්මල් ගෙන දෝත පුරා
 3. මිහිදුම් සළු තිර පැළඳි නමුණුකුළ 4. වෙනදා ඉඳිකඩ අද මට හරස් වෙලා

23. තද්ධිත පදයක් ඇතුළත් වී **නැති** වාක්‍ය තෝරන්න.
 1. එකල මුහුදුබඩ පෙදෙස් හි ආර්ය ගෝත්‍රික නාගයෝ ආධිපත්‍ය ගෙන විසූහ.
 2. අවැසි අවස්ථාවේ දී රුසියානුවෝ අපට උපකාර කළහ.
 3. වරලස පිට මැද උනා, උප්පලවණ්ණා උයන් කෙළියට ගියා ය.
 4. රතුතොල් විදා ඇය මදහස පෑවා ය.

24. කෘදන්ත පදයක් **යෙදී නැති** වරණය තෝරන්න.

1. මත්මත් කරවන දන මුළු දෙරණ
2. හෙළන නගන අත නුවනග කැළුම් දිදී
3. නටන නැටුම් මත පිනවයි
4. කරනු බැරි තහනම්

25. දී ඇති පද්‍ය පාදවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල වියරණ විධිය නිවැරදි ව පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

ගෙන මිණි වෙණ තත් **නියගින් මැද** රුවට
කන හෙව **කියන බුදුගුණ** ගී මියුරු කොට

1. විශේෂණ, විභක්ති, ක්‍රියා, විශේෂණ
2. සන්ධි, ක්‍රියා, කෘදන්ත, සමාස
3. විභක්ති, කෘදන්ත, විශේෂණ, තද්ධිත
4. සන්ධි, කෘදන්ත, තද්ධිත, විශේෂණ

- **අංක 26 සිට 28 තෙක් ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

26. පළිගත නොහැකි නිසා පිළිගැනීම

1. අත දීලා දත නියවීම
2. වඳින්ට ගිය දේවාලෙ ඉහේ කඩා වැටීම
3. කපන්ට බැරි අත සිඹීම
4. දෙබරෙට ගල් ගැසීම.

27. වැඩි වැඩියෙන් අවුල් ඇති කිරීම.

1. ඇවිලෙන ගින්නට පිදුරු දැමීම.
2. කබලෙන් ලිපට වැටීම.
3. කණා ගල් ගැසීම
4. දෙබරෙට ගල් ගැසීම.

28. තමා සතු දේ අනුන්ට දී වෙනත් අයගෙන් එය ලබන්නට උත්සාහ කිරීම.

1. දෙසේ හැටියට බාසේ
2. අත දීලා දත නියවීම
3. අනුන්ගෙ පානින් එළිය බැලීම
4. අඬුව තියෙද්දී අත පුළුස්සා ගැනීම.

- **අංක 29 සිට 30 දක්වා ප්‍රශ්නවල ඇති පෙළපොතේ උද්ධෘත ප්‍රකාශ කළේ කවුරුන් දැ'යි අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.**

29. 
- මට තවත් එහාට නං යන්න බැහැ
- මට මේ රුපියල් පහ ගන්න බැහැ
- මම එනව වෙනදට වැඩිය කලියෙන්
- ඒක හොය හොය හිටියෙ

1. මන්ද්‍රි, බෙලෙක්, අදිකාරම්, දයා
2. දයා, අදිකාරම්, මන්ද්‍රි, බෙලෙක්
3. දයා, අදිකාරම්, බෙලෙක්, මන්ද්‍රි
4. මන්ද්‍රි, බෙලෙක්, දයා, අදිකාරම්

30. 
- කරුණාකරල මේක කියවන්න.
- විවේක කාලෙදි පංති කාමරේ හිටියෙ උඹ විතරක්මයි
- මේ මග සසිනා මිනිසා ආදියේ මා රක්‍ෂා කළ මිනිසා ය.
- පැයෙන් පැය ම කල් ගත වෙනවා වැඩියි.

1. වං ලූං, ජිම්, උදුම්බරා, නවරත්න
2. නවරත්න, වං ලූං, උදුම්බරා, ජිම්
3. නවරත්න, ජිම්, උදුම්බරා, වං ලූං
4. වං ලූං, නවරත්න, උදුම්බරා, ජිම්

- **අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවල ඇති 1, 2, 3, 4 යන වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.**

31. 
1. අප නායකයෝ වෙමු.
2. රටවැසියෝ නීතිගරුක විය යුතු ය.
3. දරුවෝ අනාගත පුරවැසියන් ය.
4. අප යහපතෙහි හැසිරෙති'යි දෙමාපියෝ සිතති.

32. 
1. ප්‍රදර්ශනයේ විවිධ අංශ නැරඹීම අපේ වැඩසටහනට ඇතුළත් විය.
2. රැස්වීම අවසානයේ සියල්ලන් ම නිවෙස් බලා ගියාය.
3. අපි එතැනට කැඳවනු ලැබුවේ ගුරුවරු විසිනි.
4. ක්‍රීඩා තරගයට සහභාගි වූ ක්‍රීඩකයන් සියල්ලෝ ම උනන්දුවෙන් ක්‍රීඩා කළෝ ය.

33. 1. ඇතැම් දෘශ්‍ය මාධ්‍ය විසින් දරුවන් නොමග යැවෙති.
2. ක්‍රිකට් ක්‍රීඩකයන් විසින් අනුශූරතාව හිමි කර ගන්නා ලදී.
3. ගුරුවරුන් විසින් සිසුන්ට මග නොමග කියා දෙති.
4. විමලරත්න කුමාරගමයන් විසින් පද්‍ය රැසක් කරන ලදහ.

34. 1. ශ්‍රමදානය සඳහා බොහෝ වැඩිහිටියන් සහභාගි වී ඇත.
2. ඔහු චිත්‍ර ශිල්පියෙක් පමණක් නොව සංගීතඥයෙක් ද විය.
3. වසන්ත සැණකෙළිය සඳහා දරුවෝ සූදානම් වී ඇත.
4. විත්තිකරුවන්ගෙන් අයෙක් නිදහස් වෙති.

35. 1. මිනිස්සු සත්‍ය වසන් කරන්නේ ඇයි?
2. සුරතල් සත්තු ඇති කරන බොහෝ මිනිසුන් සංවේදී අය වෙති.
3. දේශපාලන නායකයකු සභාව අමතද්දී මිනිස්සු අත්පොළසන් දුන්හ.
4. තාරකා සමූහය අහසේ බබළති.

- අංක 36 සිට 40 දක්වා යෙදී ඇති එක් එක් වාක්‍යයේ වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

36. කතාවක් කියන විට එය අනුපිළිවෙළින් කිවයුතු ද සහභාගි වූවකු දුටු ලෙසින් කිවයුතු ද යන් කතුවරයා තීරණය කරයි.
1. කතුවරයාට කතාව කියන ආකාරය ගැටලුවකි.
2. කතාවක් රසවත් වන්නේ කියන ආකාරයෙනි.
3. කතාවක් කිවයුතු ආකාරය තීරණය කරන්නේ කතුවරයා ය.
4. කතුවරයා අනුගමනය කරන ක්‍රමය අනුව කතාව රසවත් වේ.

37. ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවත්නා ඩෙංගු උවදුර මැඩලීමට රජය උත්සුක වීම කාගේත් සතුට කරුණකි.
1. පැතිරෙන ඩෙංගු උවදුර වැළැක්වීමට රජය ක්‍රියා කිරීම යහපත් ය.
2. වසර කීපයක සිට ඩෙංගු උවදුර පැතිරෙන බව රජය කියයි.
3. රටපුරා ශීඝ්‍රයෙන් වර්ධනය වන ඩෙංගු උවදුර මැඩලීමට ක්‍රියා කිරීම සතුටට කරුණකි.
4. කාගේත් සොම්නසට හේතුවක් වන්නේ ඩෙංගු උවදුර මර්දනය සඳහා රජය උනන්දුවීමයි.

38. ගැඹුරු දහම් කරුණක් පොදු ජනතාවට අවබෝධ කරවීම සඳහා උපමාවෙන් පිරුළෙන් සරල සද්ධර්මරත්නාවලිය ලියා ඇත.
1. සද්ධර්මරත්නාවලියේ ගැඹුරු දහම් කරුණු නිසා රසවත් ය.
2. සද්ධර්මරත්නාවලිය උපමා, පිරුළු යොදමින් ගැඹුරු දහම් කරුණු රසවත් ව ලියා ඇත.
3. ගැඹුරු දහම් කරුණු ඉගෙනීමට සද්ධර්මරත්නාවලිය කියවිය යුතුය.
4. සද්ධර්මරත්නාවලියේ උපමා හා පිරුළු ආදියෙන් ගැඹුරු දහම් කරුණු ලියවී ඇත.

39. අපේ වන සම්පත ආරක්ෂා කර ගැනීම සඳහා දැනට පවත්නා වනාන්තර රැක ගන්නා අතර ම අලු වන රෝපණයට ද නිසි පියවර ගත යුතු ය.
1. අලුත් කැලෑ වැවීම මගින් වනය රැක ගත හැකියයි මතයක් පවතී.
2. අපේ කැලෑ රැක ගත හැක්කේ කැලෑ රැකීමෙන් නොව, වන වගාවට මුල්තැන දීමෙනි.
3. අපේ වනාන්තර වැඩි දියුණු කිරීම සඳහා ගස් වර්ග වැවිය යුතු ය.
4. වනාන්තර ආරක්ෂා කිරීමෙහි මෙන් ම ඒවා වැවීමෙහි ද නිරතවීමෙන් අපේ වනාන්තර රැක ගැ හැකි ය.

40. අධිරාජ්‍යවාදි යටත් විජිත යුගයේ දී ඇරඹි වැවිලි කර්මාන්තය රටපුරා ක්‍රමයෙන් පැතිර ගිය බ නොරහසකි.
1. පසු කලෙක රටපුරා පැතිර ගිය වැවිලි කර්මාන්තය ආරම්භ වූයේ අධිරාජ්‍යවාදී යුගයේ දී ය.
2. වැවිලි කර්මාන්තය අධිරාජ්‍යවාදීන් ආරම්භ කළ බව රහසක් නොවේ.
3. වැවිලි කර්මාන්තය මෙරටට හඳුන්වා දුන්නේ අධිරාජ්‍යවාදීහු ය.
4. අධිරාජ්‍යවාදී යුගයේ සාර්ථක වූ කර්මාන්තයක් ලෙස වැවිලි කර්මාන්තය දැක්විය හැක.

(ලකුණු 40

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

නම / විභාග අංකය : ............................................................................ කාලය පැය 02 යි.

(i) සිට (x) දක්වා සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට උත්තර නොලියන්නේ නම් අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

1. i. ක, ඛ, ග, ඝ, ඞ අක්ෂර - කණ්ඨජාක්ෂර නම්
   (අ) ප, ඵ, බ, භ, ම අක්ෂර ................ වේ. (ආ) ත, ථ, ද, ධ, න අක්ෂර ................ වේ.

   ii. අර්ථය ගම්‍යමාන වන සේ, ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකි දෙකක් තනන්න.
   (අ) කිරන : ..........................................................................
   (ආ) කිරණ : ..........................................................................

   iii. මේ පද කාණ්ඩ සඳහා පොදුවේ යෙදිය හැකි "සර්ව නාම" පද යොදා හිස්තැන් පුරවන්න.
   (අ) ලීලයි, කමලයි, සේනයි, කපිලයි. ....................................
   (ආ) සම්භාවනීය අමුත්තනි, දෙමාපියනි, මිත්‍රවරුනි, ....................................

   iv. "වදාරා" යන්න "වදාළේ ය" වශයෙන් සැකසේ නම්,
   (අ) වපුරා : .............................. (ආ) විචාරා : ..............................

   v. ක් + ඍ - කෘ ලෙස සැකසෙන විට,
   (අ) ජ් + ඖ : .............................. (ආ) ත් + ඓ : ..............................

   vi. "බල" යන ධාතු ප්‍රකෘතිය භාවිතයට ගෙන පහත සඳහන් ක්‍රියාරූප සකසා ලියන්න.
   (අ) පූර්ව ක්‍රියා .............................. (ආ) ප්‍රයෝජ්‍ය ක්‍රියා ..............................

   vii. පහත දැක්වෙන පද කාණ්ඩ සඳහා පොදුවේ ව්‍යාකරණානුකූල ව භාවිත වන නම් ලියන්න.
   (අ) රළ, පෙළ, මුළ, කැල - ..............................
   (ආ) කෙනෙක්, ඇතැමෙක්, අයෙක්, සමහරු - ..............................

   viii. පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කොට ලියන්න.
   (අ) හෙළ කලා කෙත අස්වැද්දූ කලාකරුවන් සාහිත්‍ය ලෝකයේ ගෞරවයට පාත්‍ර වෙයි.
   ..........................................................................
   (ආ) මමත් රශ්මිකත් ගමන්මලු වාහනයට පැටවීම්.
   ..........................................................................

   ix. "ඉන්ද්‍ර චාප" යන්නට "ඉඳු සැව්" යෙදේ නම්,
   (අ) ගන්ධ කුටි .............................. (ආ) චක්‍රවර්ති ..............................

   x. මේ පද සඳහා පොදු ව්‍යවහාරය ලියන්න.
   (අ) හේලංකඩ .............................. (ආ) අලියං වෙලාව ..............................

(2 × 10 = 20)

2. පහත සඳහන් ව්‍යූහ අතරින් එකක් තෝරා ගෙන වචන 250ට නොඅඩු රචනයක් ලියන්න. මාතෘකාවක් ද යොදන්න.

   (අ) සහෘදයින් වැඩි පිරිසක් ප්‍රියකරන සාහිත්‍යාංගය ගීතයයි. ක්ෂණයකින් ගත සිත සුවපත් කරන හදවතට දැනෙන අර්ථ හා භාව පූර්ණ ගීත සමුච්චයක් අප සතු ය. එමෙන් ම කයට පමණක් දැනෙන සංගීතය සංකලනය වූ ශබ්ද සමුදායක් පමණක් වන ගීත ද විවිධ මාධ්‍ය ඔස්සේ අපට ශ්‍රවණය කළ හැකි ය. කලාව ආනන්දයෙන් ඇරඹී ප්‍රඥාවෙන් කෙළවරවීමට නම් අපේ ගීත කලාව යා යුතු අභිමානවත් ගමන් මග වන්නේ ............

   (ආ) අපේ වාරි සංස්කෘතිය අපට අභිමානයකි. වැව මුල් කරගෙන ගොඩනැගුණු ගම්මානය ද විහාරය ද නිසා ලාංකිකයා තුළ යහපත් සංස්කෘතිකාංග ද උතුම් ආචාර ධර්ම ද ගොඩනැගුණි. ඒ ඇසුරින් ගොඩනැගුණු 'වැවයි දාගැබයි ගමයි පන්සලයි' යන සංකල්පය ජනප්‍රිය සංස්කෘතිය විසින් ගිලගනිමින් පවතී. නැවත ඒ සොඳුරු අතීතයට යා නොහැකි බව සැබෑවකි. එහෙත් කළ හැකි යමක් නැත්තේ ද නොවේ.

(ඉ) තමා කරන සේවයට අපෙන් කිසිවක් නොඉල්ලන, තමා සතු සියල්ල පරාර්ථය වෙනුවෙන් ක කරන, ලොව ශ්‍රේෂ්ඨතම දානපතියෙක් අප අතර වාසය කරයි. ඒ තොම්නිස් ක්‍රියාකාරකම් හේතුවෙ අප අතරින් දුරස්වෙමින් පවතින වන ගහනයයි. "පලගත් අතු නසා පල කන්නවුන්" නොවී වනයෙ ප්‍රයෝජන ගත යුත්තේ ය. ඒ සඳහා රාජ්‍ය ආයතන, සංවිධාන හා පාසල් මට්ටමින් අප සංවිධානය වි යුත්තේ ය.

(ඊ) "නේක වර්ණ මලින් සැදුණු තුරුලිය ගොමු පිරිවරා ගත් අලංකාර ගෙළයනකි. පසෙකට වන්නට වූ කුඩා උස් බිමක අලංකෘත මැදුරකි. ඒ මැදුරේ බරාඳයේ තැබූ සැපදායි පුටුවකට බර දී සිටින නීලකාන මැණිකේගේ දෑස්වල ඇත්තේ බලාපොරොත්තුවක සේයාවකි .........." මෙතැන් සිට නිර්මාණාත්ම රචනාවක් ගොඩනගන්න. (ලකුණු 2

3. පහත දැක්වෙන පාඨය වචන 50 - 55 අතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වච ගණන උත්තරය අග ලියන්න.
අනුභූතිවාදය මූලික වශයෙන් ම පවසනුයේ සියලු ම ඥානයන් අනුභූතිය ඇසුරෙන් ම ගොඩ නැගෙ බවයි. අනුභූතියේ සීමාව සහ ඥානයේ සීමාව ද එකක් ම බව ඔව්හු පිළිගත්හ. අනුභූතියෙන් බාහිර ඥානයක් නොමැති බව ප්‍රකාශ කරන "ලොක්" සඳහන් කරනුයේ උපතේ දී මිනිස් මනස හිස් පුවරුවක සමාන වන බවයි. බාහිර ලෝකයෙන් ලැබෙන අනුභූතීන් ඇසුරින් ම ඥානය සඳහා අවශ්‍ය මූලික පදන ගොඩනැගෙන බව මෙහි දී ප්‍රකාශ කෙරුණි. බුද්ධිවාදීන් ඉදිරිපත් කළ සහජ සංකල්පවාදය බැහැර කරමි ඥානය සඳහා අවශ්‍ය මූලික දත්ත පංචේන්ද්‍රියන් ඇසුරින් ලබාගන්නා බව අනුභූතිවාදීන් ප්‍රකාශ කර ඇ අතීත සිද්ධියක් පිළිබඳ ව කල්පනා කරන විට දී පවා අතීත අනුභූතීන් වැදගත් වන බව ඔව්හු ප්‍රකාශ කළ ඉන්ද්‍රිය අනුභූතිය පිළිබඳ ඔවුන්ගේ විශ්වාසය කොතරම් ප්‍රබල වී ද යත් ප්‍රත්‍යක්ෂයෙන් තොරව ද්‍රව්‍ය වස්තුන් පැවැත්මක් තිබිය නොහැකි බව ප්‍රකාශ කරන්නට පවා ඔවුහු උත්සාහ ගනිති. "පැවැත්ම යනු ප්‍රත්‍යක්ෂයයි යන බර්ක්ලේගේ ප්‍රකාශය ඒ බව තහවුරු කරන්නකි. ඔහු සඳහන් කරන ආකාරයට "මට ප්‍රත්‍යක්ෂ නොවන විට හෝ මගේ මනසෙහි නොපවතින විට හෝ දෙවියන්ගේ මනසේ නොපවතින හෝ යමකට කිසි පැවැත්මක් නැත්තේ ය. මෙහි දී ප්‍රත්‍යක්ෂය පිළිබඳ ව ඔවුන්ගේ අවධානය යොමු වී ඇතත් දෙවියන් ස ආත්මය යන සංකල්ප පිළිගන්නට ලොක් සහ බර්ක්ලේ යන දෙදෙනා ම ඉදිරිපත් වී සිටීම ගැටලු මා කරන්නකි. (ලකුණු 10

4. පහත සඳහන් ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
I වන පරාක්‍රමබාහු රජුගේ ගල්විහාර කතිකාවතින් පොළොන්නරු යුගයේ මධ්‍ය භාගය වන විට සිංහ භාෂාව වෙත ආරෝපිත සංස්කෘතයේ ප්‍රභාව මනාව පැහැදිලි වෙයි. සාඩම්බර වාග් ප්‍රගල්භයෙන් පිරුණ සංස්කෘතයේ ගාම්භීර බව සිංහල භාෂාව හා රචනා රීතිය වසාගෙන නැඟී සිටිනා අයුරු මින් පැහැදි වෙයි. මෙහි ලා උපයුක්ත වදන්වලින් හතරෙන් තුනක් ම සංස්කෘත තත්සම වදන් ය. සිංහල වදන් කීපය සමග සංස්කෘත වචන රාශියක් අමුණා මිශ්‍ර සිංහලය නිපදවා ඇත. එයින් සිංහල ගද්‍ය රචනා ශෛලි විදග්ධ ස්වරූපයක් ගත්වා ඇත. මෙසේ සිංහල ගද්‍ය රීතියේ විශේෂ වෙනසක් ඇතිවීම පමණක් නො සිංහල වාක්කෝෂයේ පෘථුලභාවය ඇතිවීම ද සංස්කෘත භාෂාවේ ආභාසයෙන් සිදු වීම ඉතා වැදගත් වෙයි

i. සිංහල භාෂාව සංස්කෘත භාෂාවෙන් ඔප් නැංවුණු බව කතුවරයා පෙන්වන්නේ කුමන සාධකයා පදනම් කරගෙන ද? ....................

ii. සිංහල භාෂාවට ආරෝපණය කළ සංස්කෘතයේ ප්‍රභාව මැනවින් කැපී පෙනුනේ කවර කාලයක ද?
....................

iii. සංස්කෘතයේ ගාම්භීරය මතු වූයේ අපට අනන්‍ය වූ කුමන අංග යටපත් කරමින් ද?
....................

iv. සකු බස ආභාසයෙන් සිංහලයට ඇති වූ වෙනස්කම් දෙකක් ලියන්න.
- .................... 
- ....................

v. පහත දැක්වෙන වචනවල තේරුම ඔබේ බසින් ලියන්න.
- වාග් ප්‍රගල්භය ....................
- පෘථුලභාවය ....................

(ලකුණු 10

5. හෝමාගම ප්‍රදේශයේ පුවත්පත් වාර්තාකරුවකු වන පසන් සහසකර හෙට්ටිගේ තබා ගත් සටහනක් පහත දැක්වේ.

- ප්‍රදර්ශනයේ නම : "සාම්ප්‍රදා"
- තේමාව : අපේ මුතුන් මිත්තන් භාවිත කළ භාණ්ඩ හා ඒවායේ අනුරූ ප්‍රදර්ශනය
- දිනය : 2012. 11. 10
- ස්ථානය : මීගොඩ "දම්රද" කලා සංසද මූලස්ථානය
- ප්‍රධානත්වය : සංස්කෘතික කටයුතු භාර ඇමතිතුමා
- සහභාගීත්වය : • හෝමාගම ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන • ආරාධිත පළාත් සභා නියෝජිතයින්
- මෙහෙයවීම : මීගොඩ "දම්රද" කලා සංසදය

උක්ත සටහන ආශ්‍රයෙන් වචන 100 - 125 අතර වන සේ පුවත්පත් වාර්තාවක් සකසන්න.

නැතහොත්

- විවිධ මාධ්‍ය ඔස්සේ විකාශනය වන "තරු" සංස්කෘතිය පිළිබඳ විමසීමක යෙදෙමින් පුවත්පතකට තිරු ලිපියක් ලියන්න. වචන 100 - 125 අතර සෑහේ. (ලකුණු 15)

සියළුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2012

## 11 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

නම / විභාග අංකය : ................................................................................ කාලය පැය 02 යි.

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර ලියන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත්, 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

1. (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. "තව ජාතියක් තියෙනව ඒක ගත්තෙ නැත්තෙ ඇයි?"
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?
(ආ) මෙහි තව ජාතියක් යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

ii. "මාගේ සුරුකම් බලා වදාළ, මැනව"යි වාසි කියාලා
(අ) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?
(ආ) මෙම ප්‍රකාශය කළ තැනැත්තා ඉන්පසුව කුමක් කළේ ද?

iii. නැඟෙන සැණකෙළි හඬින් සිව් දෙස
පිරී අබිසෙස් ලැබී සොම්නස
(අ) මෙම පද්‍ය පාද උපුටා ගත් කෘතිය නම් කරන්න.
(ආ) "අබිසෙස් ලැබී සොම්නස" පාඨයේ අදහස ලියන්න.

iv. "මේ බත් තළිය නිසා කප් කෙළ දහස් ගණනේ දුකක් නොවේව'යි කොට නිමි වොටුන්නේ ඔබන මැණිකක් මෙන් මේ බත් තළිය නිවනින් කුළු ගනිව"යි පතා ගත්හ.
මෙම පාඨයේ සඳහන්
(අ) උපමාව .................................. (ආ) උපමේය .................................. වෙන් කොට දක්වන්න.

v. (අ) "පියසේන ඇසූ ප්‍රශ්නයක්" පැදි පෙළ කාගේ නිර්මාණයක් ද?
(ආ) එම කිවිඳිය / කවියා ලියූ වෙනත් කාව්‍ය සංග්‍රහයක් නම් කරන්න.

vi. "මා අනාථභාවයේ කළුපාට රාත්‍රියක ගිලෙමින් සිටින බවක් මට දැනේ".
(අ) මෙසේ සිතන්නේ කවුරුන් ද? (ආ) මෙසේ සිතීමට ආසන්න හේතුව කුමක් ද?

vii. ළා අතු රිකිලි, රුක් ගොමු, ලියමඬුළු ඉහේ
දූඩි වේදනාවෙන් මිරිකී හඬනු ඇහේ
(අ) මෙහි සඳහන් කාව්‍යාලංකාරය කුමක් ද?
(ආ) මෙම කවි පද ඇතුළත් පද්‍ය පන්තියේ රචකයා අයත් සාහිත්‍ය යුගය නම් කරන්න.

viii. "මගේ ඉඩම මට ම දෙන්න හදනවනේ. හරි පුරෝගමිකාර මිනිහෙක්"
(අ) "මගේ ඉඩම" යනුවෙන් සඳහන් ඉඩමේ නම ලියන්න.
(ආ) පුරෝගමිකාර මිනිහෙක් යයි හඳුන්වනු ලබන්නා කවරෙක් ද?

ix. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සඳහා යෙදුණ
(අ) විරුද නාමය කුමක් ද? (ආ) මෙතුමා විසින් රචිත පද්‍ය ග්‍රන්ථයක් නම් කරන්න.

x. සතුටෙන් හා දුකෙන් අවසන් වන නාට්‍ය වර්ග දෙක හැඳින්වීමට යොදන නම් පිළිවෙළින් ලියන්න.
(අ) ........................................................ (ආ) ........................................................

(ලකුණු 2 × 10 = 20)

2. පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල **තද කළු අකුරෙන්** මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්
ඉන්පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

i. "පුතණුවන්ගෙන් සාරදහසක් හා, **යෙහෙලනියන්ගෙන්** සාරදහසක් හා, මෙසේ සොළොස් දහස
නීලකර්ෂාපණ සංඛ්‍යාත වූ රන් දී' අසුන් යෙදූ රථයක් හා දාස දාසීන් **ගවමහීෂයන්** ආදී වූ බොහෙ
සම්පත් දුන්හ.

ii. **ඉත පුරුදු** පෙර කල
දූත් තොප මෙසේ කී කල
නොකොට තව කොලහල
සොඳයි පවා ගනිම් **මනකල**

iii. ඒ **දුර්වච වූ** කාරණයෙන් ම නුවණැත්තන්ගේ බස් නොගෙන සියුම් මුවහත් ඇති ඛඩ්ගයෙන් දෙක
කොට නසන ලදුව මඟ වැටී **ඔත්තෙහි වේද?** තා එක තැනැත්තවු නිසා දහසක් පුරුෂයෝ ජීවිතක්ෂය
පැමිණියෝ වේදැ'යි වදාරා ඉකුත්වත් දක්වා වදාළ සේක.

iv. **උසේ කුළින් කුළ** බැසැ නැගෙමින් මෙවලා
තොසේ වඩා කෙළිමින් ඇවිද පෙරකලා
මෙසේ වියෝදුක් උසුලන්ට වූ කලා
කෙසේ තිබේ'දෝ හිමි සඳිනි **පණ** නලා (ලකුණු 5 × 4 = ලකුණු 20

- 3, 4 ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන ගණන 125ක් පමණ තිබීම සෑහේ.

3. "අපටත් දවසක ඉර පායාදෝ" කෙටිකතාවේ සිරියාවතී විසින් අඳින ලද චිත්‍රය තුළින් ඇයගේ

(අ) පවුල් පරිසරය පිළිබඳ තොරතුරු (ආ) නිර්මාණ කුසලතාව

ප්‍රදර්ශනය කරයි. එක කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් මෙම කරුණු පැහැදිලි කරන්න.

නැතහොත්

දයාසේන ගුණසිංහ මහතා විසින් රචිත "කිසාගෝතමියක නොවේ" කවි පෙළ කියවන සහෘද සිත වඩා
කම්පනයට පත් කිරීමෙහි ලා

(අ) මවගේ අසරණභාවය (ආ) හරසුන් මිනිසුන්ගේ ජීවන පැවැත්ම

හේතු වෙයි. එක් කොටසකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15

4. උත්තරෝලිය වස්තුවෙන් එවක සාමාන්‍ය ජන ජීවිතයේ පැවති

(අ) ආර්ථික තත්ත්වය පිළිබඳවත් (ආ) සමාජ තොරතුරුත්

හෙළිදරව් කරයි. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

නැතහොත්

සිදුහත් බෝසතුන් මහාමායා දේවිය කුස පිළිසිඳ ගැනීම ජනකවියා

(අ) ආශ්චර්යය හා (ආ) භක්තිය දනවන

අයුරින් නිර්මාණය කර ඇත. එක කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් මේ මතය විමසන්න.

(ලකුණු 15

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන 100ක් පමණ තිබීම සෑහේ.

5. කිසියම් අවස්ථාවක් සජීවී ලෙස පද්‍යයෙන් නිරූපණයෙහි ලා තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් දැක්
කුසලතාව "සිදු වූ සෙයින් අදහස" පද්‍ය පන්තිය ඇසුරෙන් උදාහරණ තුනක් දක්වමින් පැහැදිලි කරන්න

(ලකුණු 10

6. "පියසේන ඇසූ ප්‍රශ්නයක්" කවි පෙළ සඳහා කිවිදිය ජනවහරෙන් පෝෂණය වූ බස් වහරක් යොදා තිබී
එහි සාර්ථකත්වයට හේතු වී ඇත.

උදාහරණ තුනක් දක්වමින් මේ කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10

7. ජාතක කතාකරුවා විවිධ පුද්ගල චරිතවල ස්වභාවය හා ඒ අනුව ඇතිවන ප්‍රතිඵල විභාග කිරීමට සාර්ථ
ප්‍රයත්නයක් දරයි.

වේදබ්භ ජාතකයෙන් උදාහරණ තුනක් දක්වමින් මේ අදහස විමසන්න. (ලකුණු 10